# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/79 - 2019 මැයි මස 17 වැනි සිකුරාදා - 2019.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද,

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ වෙංකරතාස් ඉලවරසි අයත් වන්නා වූ අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වසන්ති සිවකඩාඩ්සම් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පේදුරුතුඩුව නගර සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රම් ක්‍රිස්ටි අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වසන්ති සිවකඩාඩ්සම්, පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්. සී. අමල්රාජ්,
තේරීම්භාර නිලධාරී,
පේදුරුතුඩුව නගර සභාව.

2019 මැයි මස 16 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

05 - 945

1A - G 30114 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*